# නවමො පාඨො

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතරන්තො භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. තතො තත්ථ තං අක්ඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි. 'සියා ගබ්භො. තථා හිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථී'ති. තං අස්සමං නෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස ඛීරං නිබ්බත්ති. තතොප්පභුති ච ඛීරභත්තං ලභති. සො භත්තං භුඤ්ජිත්වා ඛීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං යං යං උදරං පවිට්ඨං, තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං ලිච්ඡවී අහෙසුං. එවං තෙ නිච්ඡවිතාය ලිච්ඡවීති පඤ්ඤායිංසු.

(ඛුද්දකපාඨට්ඨකථා)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **අඤ්ඤතරො** | (ස,නා) | - | එක්තරා |
| **ගොපාලකුලං** | (ස) | - | ගොපලු කුලය |
| **ඔතරන්තො** | (කි) | - | බසින්නේ |
| **පාතොව** | (සං) | - | උදෑසන ම |
| **නිස්සාය** | (නි) | - | නිසා |
| **අග්ගහෙසි** | (ක්‍රි) | - | අල්ලා ගත්තේ ය |
| **අක්ඛරපට්ටකං** | (ස) | - | අකුරු ලියූ රෙදි කැබැල්ල |
| **රාජමුද්දිකාලඤ්ඡනං** | (ස) | - | රාජ්‍ය මුද්‍රා තැබූ ලාංඡනය |
| **මුඤ්චිත්වා** | (පූ.ක්‍රි.) | - | මුදා |
| **දිස්වානස්ස** | (සං) | - | (දිස්වාන + අස්ස) දැක ඔහුට |
| **සියා** | (ක්‍රි) | - | වන්නේ ය |
| **ගබ්භො** | (නා) | - | දරු ගැබ |
| **දුග්ගන්ධපූතිභාවො** | (ස) | - | දුර්ගන්ධ හා නරක් වූ |
| **සුද්ධෙ** | (කි) | - | පිරිසිදු |
| **ඔකාසෙ** | (නා) | - | එළිමහනෙහි |
| **අහෙසුං** | (ක්‍රි) | - | වූහ |
| **අඩ්ඪමාසච්චයෙන** | (ස) | - | අඩමසක් ඇවෑමෙන් |
| **සුවණ්ණබිම්බසදිසො** | (ස) | - | රන් ප්‍රතිමාවක් සමාන |

| | | | |
|---|---|---|---|
| දාරකො | (ත) | - | පිරිමි දරුවා |
| පීළකා | (නා) | - | බිබිලි |
| උට්ඨහති | (ක්‍රි) | - | පැන නඟී |
| පුත්තසිනෙහො | (ස) | - | පුත්‍ර ස්නේහය |
| අඞ්ගුට්ඨකතො | (නා) | - | මාපට ඇඟිල්ලෙන් |
| තතොප්පභුති | (සං) | - | එතැන් පටන් |
| ඛීරභත්තං | (ස) | - | කිරිබත් |
| මණිභාජනගතං | (ස) | - | මැණික් බඳුනකට ගිය |
| විය | (නි) | - | මෙන් |
| දිස්සති | (ක්‍රි) | - | පෙනෙයි |
| ආසිඤ්චති | (ක්‍රි) | - | ඉසියි |
| නිච්ඡවිතාය | (න) | - | සිවිය නැති හෙයින් |

**අභ්‍යාස**

01. 'කස්මා ලිච්ඡවී'ති වදන්ති' ඡේදය සිංහලට නඟන්න.

02. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තාපසො කුහිං වසති?
ii. තාපසො අක්ඛරපට්ටකං රාජමුද්දිකලඤ්ඡනං ච දිස්වා කිං චින්තෙසි?
iii. කස්මා මංසපෙසියා පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු?
iv. දාරිකං ච දාරකං ච දිස්වා තාපසො කිං අකාසි?
v. කස්මා ලිච්ඡවීනං ඉත්ථං නාමං අහෙසුං?

03. පිළිතුරු සපයන්න.

i. තාපස දිනචර්යාවේ ඇති මූලික ලක්ෂණයක් ලියන්න.
ii. රාජ්‍යමුද්‍රා තැබීමෙහි ගූඪාර්ථය (සැඟවුණු අර්ථය) කුමක් ද?
iii. තවුස් දිවියේ අල්පේච්ඡත්වය ප්‍රකට වන කරුණු දෙකක් දක්වන්න.
iv. දරු සෙනෙහස පිළිබඳ බුදුරදුන්ගේ ඉගැන්වීම කෙබඳු ද?
v. ලිච්ඡවීන්ගේ රාජ්‍ය පාලන ක්‍රමයේ පැවති සුවිශේෂත්වය කුමක් ද?

## සන්ධි

වෙන් වෙන්ව ඇති ලී කැබලි දෙකක් ගෙන එකට ගළපා එක ලීයක් කරන්නාක් මෙන් වෙන් වෙන්ව ළංව සිටි අකුරු දෙකක් **ලෝප, ආදේශ, ආගම, හ්‍රස්ව, දීර්ඝ, ද්විත්ව** ආදි සන්ධි කාර්යයන්ගේ ආධාරයෙන් එකට ගැළපීම සන්ධි නම් වේ.

උදා:- පාතො + එව - පාතොව
දිසවාන + අසස - දිසවානසස
එතං + අහොසි - එතදහොසි
තතො + පහුති - තතොපපහුති

පාලි භාෂාවේ ප්‍රධාන සන්ධි ප්‍රභේද 04ක් ඉගැන්වේ.

1. **ස්වර සන්ධි**
2. **ව්‍යඤ්ජන සන්ධි**
3. **නිග්ගහීත සන්ධි**
4. **වොමිස්සක සන්ධි**

පද සන්ධි කිරීමෙන් පසු සුඛොච්චාරණය, පද කෙටි වීම, භාෂාවේ ව්‍යක්ත බව ඇතිවීම හා ඡන්දස් ශාස්ත්‍රයේ දී විරිත ආරක්‍ෂා වීම ආදි ප්‍රයෝජන රැසක් ලැබේ.

## ස්වර සන්ධි

පෙර පදයේ අග හා පර පදයේ මුල ස්වරයක් ඇති විට ලොප් කිරීමකින් හෝ අන්‍ය ක්‍රමයකින් එම අකුරු ගැළපීමෙන් සිදු වෙන සන්ධි විධිය **ස්වර සන්ධි** නම් වේ.

| | |
|---|---|
| මාතු උපට්ඨානං | විසන්ධි පදය |
| මාත් + උ + උපට්ඨානං | ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම **(පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ)** |
| මාත් + උපට්ඨානං | පූර්ව ස්වර ලෝපය **(සරා සරෙ ලොපං)** |
| මාතුපට්ඨානං | අකුරු ගැළපීම **(නයෙ පරං යුත්තෙ)** |

| ස්වර සන්ධි | | | |
|---|---|---|---|
| | විස්තර | උදාහරණ | බාලාවතාර සූත්‍ර |
| ලෝපය | පූර්ව ස්වර ලෝපය | ලොක + අගෙගා - ලොකගෙගා | සරා සරෙ ලොපං |
| | පර ස්වර ලෝපය | ඡායා + ඉව - ඡායාව | වා පරො අසරූපා |
| දීර්ඝ | පූර්ව ස්වර දීර්ඝය | කිංසු + ඉධ - කිංසූධ | පුබ්බො ච |
| | පර ස්වර දීර්ඝය | යානි + ඉධ - යානීධ | දීඝං |

| | | | |
|---|---|---|---|
| ආදේශ | **අසවර්ණාදේශය**<br>ඉ, ඊ > එ<br>උ, ඌ > ඔ | බන්ධුස්ස + ඉව > බන්ධුස්සෙව<br>ගංගා + උදය > ගංගොදය | **ක්වචාසවණ්ණං ලුත්තෙ** |
| | **යකාරාදේශය**<br>එ > ය | තෙ + අජ්ජ > ත්‍යජ්ජ | **යමෙදන්තස්සාදෙසො** |
| | ඉ, ඊ > ය | වුත්ති + අස්ස > වුත්‍යස්ස | **ඉවණ්ණො යං නවා** |
| | **වකාරාදේශය**<br>ඔ, උ > ව | සො + අස්ස > ස්වස්ස<br>අනු + එති > අන්වෙති | **වමොදුදන්තානං** |
| | **දකාරාදේශය**<br>ධ > ද<br>ඇතැම් විට ව්‍යඤ්ජන අකුරක් පර කල්හි ද මෙය වේ. | ඉධ + අහං > ඉදාහං<br>ඉධ භික්ඛවෙ > ඉදභික්ඛවෙ | **දොධස්ස ච** |
| | **රිකාරාදේශය**<br>ස්වරයා කෙරෙන් පර වූ එව ශබ්දයේ එ > රි වේ. ගැළපෙන සේ පූර්වස්වර ලෝපය ද වේ. | යථා + එව > යථරිව | **එවාදිස්සරි පුබ්බො ච රස්සො** |
| | **අබ්භාදේශය**<br>අභි > අබ්භ | අභි + උග්ගතො > අබ්භුග්ගතො | **අබ්භො අභි** |
| **ආගම** | අතරට 'ය' ආදි අකුරක් පැමිණීම යි.<br>'ය' ආගම<br>'ව' ආගම<br>'ම' ආගම<br>'ද' ආගම<br>'න' ආගම<br>'ත' ආගම<br>'ර' ආගම<br>'ළ' ආගම<br>'ග' ආගම | පරි + එසති - පරියෙසති<br>භූ + ආදයො - භූවාදයො<br>කසා + ඉව - කසාමිව<br>බහු + එව - බහුදෙව<br>ඉතො + ආයති - ඉතොනායති<br>තස්මා + ඉහ - තස්මාතිහ<br>චතු + ආරක්ඛා - චතුරාරක්ඛා<br>ඡ + අභිඤ්ඤා - ඡළභිඤ්ඤා<br>පුථ + එව - පුථගෙව | **යවමදනතරලා චාගමා** |

| | | | |
|---|---|---|---|
| ද්විත්ව | ස්වරයා පර කල්හි පූර්වයේ ඇති අක්ෂරය ද්විත්ව වේ. | පති+අනන්තං = විසන්ධිය<br>පත්+ය්+අනන්තං = ඉවණ්ණො යං නවා<br>පච්+අනන්තං = සබ්බොචන්ති<br>පච්ච්+අනන්තං - පරද්වෙභාවොඨානෙ<br>පච්චන්තං - නයෙපරං යුත්තෙ | පරද්වෙභාවො ඨානෙ |
| හ්‍රස්ව | ව්‍යඤ්ජනයක් පර කල්හි පූර්වයේ ඇති දීර්ඝ ස්වරය හ්‍රස්ව වේ. | පා + එව<br>ප් + ආ + ග් + එව - යවමදනතරලාචාගමා<br>පගෙව | රස්සං |
| ප්‍රකෘති | වෙනසකට පත් නොකොට තිබෙන පද දෙක එක පදයක් සේ ලිවීම | පා + එව - පාඑව | සරෙ ක්වචි |

| ව්‍යඤ්ජන සන්ධි | | | |
|---|---|---|---|
| | විස්තර | උදාහරණ | බාලාවතාර සූත්‍ර |
| ලෝපාගම | ව්‍යඤ්ජනයක් පර කල්හි පූර්වයේ ඇති ස්වරය ඇතැම් විට ලොප් වී එතනට 'අ' ආගම වේ.<br><br>සූත්‍රයේ ඇති චකාරයේ බලයෙන් ඇතම් විට 'උ', 'ඔ' ද ආගම වේ. | සො + භික්ඛු - සභික්ඛු<br>ජානෙම + තං - ජානෙමුතං<br>කච්චිනු + ත්වං - කච්චිනොත්වං | ලොපං ච<br>තත්‍රාකාරො |
| අසමාන ද්විත්වය | වර්ගාක්ෂරයන්ගේ 2, 4 අකුරුවලට පිළිවෙළින් 1, 3 අකුරු ආදේශය වේ<br><br>(මහප්‍රාණ අකුරුවලට අල්පප්‍රාණ අකුරු වීම) | ආ + ඛාතං - අක්ඛාතං<br>උ + ඝොසො - උග්ඝොසො<br>සෙත + ඡත්ත - සෙතච්ඡත්ත<br>පඨම + ඣාන - පඨමජ්ඣාන<br>පද + ඨාන - පදට්ඨාන<br>පුණ්ණ + ථෙර - පුණ්ණත්ථෙර<br>ඡ + ධා - ඡද්ධා<br>මහා + භය - මහබ්භය | වග්ගෙ ඝොසා'ඝොසානං<br>තතියපඨමා |

| | | | |
|---|---|---|---|
| ඔකාරාගම | බ්‍යඤ්ජනයක් පර කල්හි ඇතැම් විට 'ඔ' ආගම වේ. | පර + සහස්සං - පරොසහස්සං<br>අතිප්ප + බො - අතිප්පගොබො | ක්වචි ඔ බ්‍යඤ්ජනෙ |
| ඔකාරාදේශ | බ්‍යඤ්ජනයක් පර කල්හි 'අව' උපසර්ගයට 'ඔ' ආදේශ වේ. | අව + නද්ධා - ඔනද්ධා | ඔ අවස්ස |

| නිග්ගහීත සන්ධි | | | |
|---|---|---|---|
| | විස්තර | උදාහරණ | බාලාවතාර සූත්‍ර |
| ආදේශය | **වර්ගාන්තාදේශය**<br><br>පූර්වපදයේ බිංදුවක් තිබී පර පදයේ වර්ගාක්ෂරයක් ඇති විට එම වර්ගයේ වර්ගාන්තාක්ෂරය බිංදුවට ආදේශ වේ.<br><br>සූත්‍රයේ ඇති චකාරයේ බලයෙන් ලකාරය පර කල්හි ද බිංදුවට 'ල' කාරයක් වේ. | කිං + කතො > කිඞ්කතො<br>සං + ජාතො > සඤ්ජාතො<br>සං + ඨිතො > සණ්ඨිතො<br>තං + ධනං > තන්ධනං<br>තං + මිත්තං > තම්මිත්තං<br><br>පුං + ලිංග > පුල්ලිඞ්ග | වග්ගන්තං වා වග්ගෙ |
| | **'ම'කාර, 'ද'කාර ආදේශය**<br><br>ස්වරයක් පරකල්හි පූර්වයේ ඇති බිංදුවට 'ම' හා 'ද' ආදේශ වේ. | එවං + ඉමං > එවමිමං<br>එතං + අවොච > එතදවොච | මදා සරෙ |
| | **'ඤ'කාරාදේශය**<br><br>'එ' හෝ 'හ' පරව සිට මුලින් නිග්ගහීතයක් ඇති විට 'ඤ' ආදේශ වේ. | තං + එව > තඤ්ඤෙව<br>තං + හි > තඤ්හි | එහෙඤ්ඤං |
| | 'ය' පර කල්හි ද මුලින් ඇති බිංදුවට 'ය' සමඟ 'ඤ'කාරයක් ආදේශ වේ. | සං + යොගො > සඤ්ඤොගො | සයෙච |

| | | | |
|---|---|---|---|
| ආගම | **නිග්ගහීත ආගම**<br><br>ස්වර හෝ ව්‍යඤ්ජන අකුරක් පර කල්හි නිග්ගහීතයක් ආගම වේ. | චක්ඛු + අනිච්චං > චක්ඛුංඅනිච්චං<br>අව + සිරො > අවංසිරො | **නිග්ගහීතඤ්ච** |
| ලෝපය | **නිග්ගහීත ලෝපය**<br><br>ස්වරයක් පර කල්හි මුලින් ඇති බිංදුව ලොප් වේ.<br><br>ව්‍යඤ්ජනාක්ෂරයක් පර කල්හි ද මුලින් ඇති බිංදුව ලොප් වේ. | විදූනං + අග්ගං > විදූනග්ගං<br><br>බුද්ධානං + සාසනං > බුද්ධානසාසනං | **ක්වචි ලොපං**<br><br>**ව්‍යඤ්ජනෙ ච** |
| | **ස්වරලෝපය**<br><br>බිංදුවෙන් පර වූ ස්වරය විකල්පයෙන් ලොප් වේ. | බීජං + ඉව > බීජංව | **පරො වා සරො** |
| විසංයෝග | බිංදුවෙන් පර ස්වරය ලොප් කළ විට සංයෝග ව්‍යඤ්ජන විසංයෝග වේ. | එවං + අස්ස > එවංස | **ව්‍යඤ්ජනො ච විසඤ්ඤොගො** |

## වොමිස්සක සන්ධි

වොමිස්සක සන්ධි යනු ඉහත දැක්වූ ස්වර, ව්‍යඤ්ජන, නිග්ගහීත යන සන්ධි ක්‍රම තුනේ ම මිශ්‍රණයක් ලෙස සරලව හඳුන්වාදිය හැකි ය. සංස්කෘත, ප්‍රාකෘත ආදි භාෂාවන්ගෙන් පාලි භාෂාවට පැමිණි වචනවලට පාලි ස්වරූපය ලබාදීමේ අදහසින් බාලාවතාර කතුවරයා මෙම සන්ධි ක්‍රමය හඳුන්වා දී ඇත. සන්ධි පද පිළිබඳ ගැඹුරින් කෙරෙන හැදෑරීමක දී මේ ගැන පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය. වොමිස්සක සන්ධි කාණ්ඩයේ භාවිත වන මූල සූත්‍රය මෙසේ ය.

**අනුපදිට්ඨානං වුත්තයොගතො**

★ ස්වර ව්‍යඤ්ජන නිග්ගහීත සන්ධි කාණ්ඩවල නො දැක්වූ යම් පද සිද්ධි මේ සූත්‍රයේ බලයෙන් සිද්ධ කළ යුතුය. වොමිස්සක කාණ්ඩයේ එන පද කීපයක් සූත්‍රානුසාරයෙන් මෙසේ සන්ධි කොට දැක්විය හැක.

| | |
|---|---|
| යදි + එවං | - විසන්ධි පදය |
| යද් + ඉ + එවං | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| යද් + ය් + එවං | - ඉවණ්ණො යං නවා |
| යජ් + එවං | - අනුපදිට්ඨානං වුත්තයොගතො |
| යජ් + ජ් + එවං | - පරද්වෙභාවො ඨානෙ |
| යජ්ජෙවං | - නයෙ පරං යුත්තෙ |
| | |
| බොධි + අඞ්ග | - විසන්ධි පදය |
| බොධ් + ඉ + අඞ්ග | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| බොධ් + ය් + අඞ්ග | - ඉවණ්ණො යං නවා |
| බො ඣ් + අඞ්ග | - අනුපදිට්ඨානං වුත්තයොගතො |
| බො + ජ් + ඣ් + අඞ්ග | - වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා |
| බොජ්ඣඞ්ග | - නයෙ පරං යුත්තෙ |
| | |
| ස + රති | - විසන්ධි පදය |
| ස් + අ + රති | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| ස් + අ + ම + රති | - අනුපදිට්ඨානං වුත්තයොගතො |
| ස් + උ + ම + රති | - නයෙ පරං යුත්තෙ |
| සුමරති | |
| | |
| සා + ඉත්ථී | - විසන්ධි පදය |
| ස් + ආ + ඉත්ථී | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| ස් + ආ + ත්ථී | - වා පරො අසරූපා |
| ස් + ඔ + ත්ථී | - අනුපදිට්ඨානං වුත්තයොගතො |
| සොත්ථී | - නයෙ පරං යුත්තෙ |
| | |
| ඉති + එවං | - විසන්ධි පදය |
| ඉත් + ඉ + එවං | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| ඉත් + ව් + එවං | - අනුපදිට්ඨානං වුත්තයොගතො |
| ඉත්වෙවං | - නයෙ පරං යුත්තෙ |

**අවධානයට**

බාලාවතාරයේ ඇතැම් සූත්‍රවල ක්වචි, වා, ච, නවා යන නිපාත පද දැක්වේ. ඉන් කියවෙනුයේ එම සූත්‍ර නියමය ඇතැම් විට විකල්පයෙන් සිදු වන බව යි.

**අභ්‍යාස**

01. සිංහලට නගන්න.

i. ආචරියො සිස්සෙ 'සන්ධි' නාම පාඨං පාඨයති.
ii. පුත්තාමත්ථි ධනමම්මත්ථි ඉති බාලො විහඤ්ඤති.
iii. මයං සබ්බෙව ධම්මං සුත්වා තං සාධුකං මනසිකරොම.
iv. දාරකා පුප්ඵානො'චිනිතුං වනං ගන්ත්වා සෙතානි'පි නීලානි'පි පුප්ඵානා'හරිංසු.
v. උග්ගණ්හිතුකාමා භික්ඛු පාතො'වුට්ඨාය බාලාවතාරඤ්ච නිඝණ්ඩුඤ්ච වාචෙන්ති.

02. සන්ධි කළ හැකි තැන් සන්ධි කොට පාලියට නගන්න.

i. දේවතාවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතනට එළඹියේ ය.
ii. මහණෙනි, පෙර මේ සැවැත්නුවර ම වේදේහිකා නම් ගෘහපතිනියක් වූවා ය.
iii. 'අපි ද පැවිදි වන්නෙමු'යි යන සිතුවිල්ල යසකුල පුත්‍රයාට ද ඔහුගේ යහළුවන්ට ද ඇතිවිය.
iv. අනේපිඬු සිටුතුමා ද විශාඛා මහා උපාසිකාව ද නිතර තථාගතයන් වහන්සේට උපස්ථානයට යති.
v. පෙර රජවරු සතුරන් නසා ලක්දිව එක්සේසත් කළහ.

03. පහත දැක්වෙන විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

i. ධනමෙම + අත්ථි
ii. සබ්බෙ + එව
iii. ඉති + ආදි
iv. දෙව + ඉති
v. බුද්ධානං + එව
vi. පරි + අන්තං
vii. චක්කං + ඉව
viii. ගච්ඡාමි + ඉති
ix. පාතු + අහොසි
x. කිඤ්චි + එව
xi. කසා + ඉව
xii. ප + උච්චති
xiii. පති + එති
xiv. මධු + උදකං
xv. අ + කමති
xvi. සං + ලෙඛ
xvii. යං + අනිච්චං
xviii. චක්ඛු + උදපාදි
xix. පඤ්ච + බන්ධා
xx. තං + ජාතං



නොමිලේ බෙදා හැරීම පිණිසයි

04. ''කස්මා ලිච්ඡවීති වදන්ති'' යන ඡේදයේ සන්ධි පද උද්ධෘත කොට විසන්ධිය සමග අදාළ සූත්‍රය දක්වන්න.

| උද්ධෘත පදය | විසන්ධිය | අදාළ සූත්‍ර |
|---|---|---|
| උදා :- පාතොව | පාතො + එව | වා පරො අසරූපා |
| | | |